# දූර්ලභ

## කි රි මැ ටි යා වේ මැ හි ඳු ගේ සා හි ත්‍ය සේ ව ය

විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයයේ
ශාස්ත්‍රපති උපාධිය සඳහා නියමිත පරිදි
ඉදිරිපත් කරන නිබන්ධයයි.

කර්තෘ
බස්නායක මුදියන්සේලාගේ සෙනෙවිරත්න මහලේකම

ප්‍රවේශ අංකය 15
දි ගි අංකය

1970

## පරිච්ඡේද සාරය

1. පරිච්ඡේදය:

### ඓතිහාසික පසුබිම

කිරිමැටියාවේ මැතිවරයා ජීවත් වූ දහහත්වන සියවසේ දේශපාලන පසු බිම දේශීය මූලාශ්‍ර ආශ්‍රයෙන් විමැසේ. අභ්‍යන්තර යුද්ධ, විදේශීය පරසතුරු ආක්‍රමණ, කිතුසමය හා ශිව සමය පැතිරයාම යන හේතු නිසා ධර්ම ශාස්ත්‍ර යන දෙකම පිරිහී අඳුරු යුගයක් උදාවිය.

2. පරිච්ඡේදය:

### සිංහල ජන කවිය

කිරිමැටියාවේ කවියා ගැමි කවියකු බැවින් පැරණි චිරන්තන පද්‍ය සාහිත්‍යයේ හා ජන කවි සාහිත්‍යයේ ලක්ෂණ විමසනු ලැබේ. ජන කවි ක්ෂේත්‍රය විග්‍රහකොට එහි ඇති විවිධ අඞ්ගයන් හඳුන්වා දී ඒ එක් එක් සාහිත්‍ය අඞ්ගයේ ආරම්භය හෝ වැඩීම සඳහා හෝ කිරිමැටියාවේ කවියාගෙන් සිදු වූ මෙහෙය විමසිල්ලට භාජන වෙයි.

3. පරිච්ඡේදය:

### කිරිමැටියාවේ මැතිඳුගේ ජාතක කාව්‍ය

කිරිමැටියාවේ කවියාගේ ජාතක කාව්‍යයන්ගේ විවිධත්වයක් ඇති බැවින් සිංහල ජාතක පද්‍ය සාහිත්‍යය ඓතිහාසික වශයෙන් හා විග්‍රහාත්මකව විමසිල්ලට ලක් කෙරේ. කිරිමැටියාවේ කවියාගේ උරග ජාතක කාව්‍යය, මහා ජනක ජාතක කාව්‍යය, මහාපදරඞ්ග ජාතක කාව්‍යය හා උමංදා කව රචිත වකවානුව, කර්තෘ පිළිබඳ මත භේද, මූලාශ්‍ර, අන්තර්ගත කරුණු, කාව්‍ය තත්ත්වය හා යොදා ඇති පැදි විරිත් යන කරුණු යටතේ විස්තර වෙයි.

4. පරිච්ඡේදය:

<u>කිරිමැටියාවේ කවියාගේ පුරා කථා ආශ්‍රිත කාව්‍ය</u>

ජන කවි සාහිත්‍යයේ නව අධ්‍යයකි. කිරිමැටියාවේ කවියා විසින් රචිත ජනනන්දන කාව්‍යය, සත්වලෝක කාව්‍යය හා වේතාලන් කව රචිත කාලය, කතෘ, අන්තර්ගත කරුණු මූලාශ්‍ර හා කාව්‍ය තත්ත්වය යන කරුණු කෙරෙහි සැලකිල්ල යොමා හඳුන්වා දෙනු ලැබේ. කිරිමැටියාවේ කවියාගේ වේතාලන් කව දෙමළ සාහිත්‍යයෙන් කථා වස්තුවක් ගෙන රචනා කරන ලද්දක් බැවින් ඉන්පසු දෙමළ මූලාශ්‍ර ආශ්‍රිතව ලියැවුණු කවිකතා වැඩී ගිය අයුරු ද විමැසේ.

5. පරිච්ඡේදය:

<u>කිරිමැටියාවේ කවියාගේ හටන් කාව්‍ය</u>

කිරිමැටියාවේ කවියාගේ මහහටන විග්‍රහ කොට ප්‍රධාන වශයෙන් එහි ඓතිහාසික වටිනාකමත්, වෙනත් හටන් හා ප්‍රශස්ති කාව්‍යයන්ගෙන් එය වෙනස් වූ අයුරුත් සොයා බලනු ලැබේ.

6. පරිච්ඡේදය:

<u>කිරිමැටියාවේ කවියාගේ භාෂාව</u>

කවියාගේ සියලුම කෘති ආශ්‍රයෙන් දහහත්වන සියවසේ ව්‍යවහාර භාෂාවේ ලක්ෂණ විමසනු ලැබේ. රාජාවලි භාෂාව හා කිරිමැටියාවේ කවියාගේ බස සැසඳීමෙන් තත්කාලීන ගද්‍ය භාෂාවට කවියාගේ පද්‍ය භාෂාව කෙතරම් සමාන දැයි සොයා බලනු ලැබේ.

7. පරිච්ඡේදය:

<u>කිරිමැටියාවේ මැතිඳුගේ කවිත්වය</u>

කිරිමැටියාවේ කවියාගේ කෘතිවල දක්නට ලැබෙන පොදු ලක්ෂණ උදාහරණ සහිතව විමැසෙයි. කවියාගේ කවිත්වය කෙබඳු දැයි සොයා බලන අතර ඔහු ජනකවියෙකු වශයෙන් කවර කරුණු අනුව වැදගත් වන්නේ දැයි පෙන්වා දීම අවසාන පරමාර්ථ යයි.